දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
DISTANCE AND CONTINUING EDUCATION UNIT - UNIVERSITY OF RUHUNA

## ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) පරීක්ෂණය - 2012 පෙබරවාරි
## First Examination in Arts (External) - February 2012

## දේවිප්‍ර 1.1 - දේශපාලන විද්‍යාවේ මූලධර්ම
## PS 1.1 - Elements of Political Science

කාලය පැය තුන යි

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න**
**කියවිය නොහැකි අත් අකුරුවලින් ලකුණු අඩු විය හැක.**

---

(01) දේශපාලන විද්‍යාවේ ස්වභාවය සහ විෂය ක්ෂේත්‍රය පැහැදිලි කරන්න.
(ලකුණු 20 යි)

(02) 'දේශපාලන විද්‍යාවේ අත්හදා බැලීම්වල මූලාශ්‍රය ඉතිහාසයයි.' විභාග කරන්න.
(ලකුණු 20 යි)

(03) 'ස්වාධිපත්‍යය' යනු කුමක්දැයි අර්ථකථනය කර වර්තමාන රාජ්‍යවල බලය විග්‍රහ කිරීමට එහි අදාළත්වය පෙන්වා දෙන්න.
(ලකුණු 20 යි)

(04) "රජු රජ කරතත් පාලනය නො කරයි" බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමය අවබෝධ කර ගැනීම සඳහා මේ ප්‍රකාශයේ අදාළත්වය පැහැදිලි කරන්න.
(ලකුණු 20 යි)

(05) ප්‍රංශ ආණ්ඩුක්‍රමය දෙමුහුන් (Hybrid) වන්නේ කෙසේ ද?
(ලකුණු 20 යි)

(06) ඇමරිකානු ආණ්ඩුක්‍රමය තුළ ජනාධිපතිවරයාගේ තත්වය හා බලතල පැහැදිලි කරන්න.
(ලකුණු 20 යි)

(07) 'නීතියේ ආධිපත්‍යය' යනු කුමක් දැයි පහදා දී වර්තමාන ශ්‍රී ලාංකික සංදර්භය තුළ එය සෝදා පාලුවට ලක්ව ඇති ආකාරය විවේචනාත්මකව විග්‍රහ කරන්න.
(ලකුණු 20 යි)

(08) (i) දේශපාලන පක්ෂයක් යනු කුමක් ද?
(ii) නූතන දේශපාලන පක්ෂවල කාර්ය භාරය කුමක් ද?
(එක් කොටසකට ලකුණු 10 බැගිනි)

(09) ලිබරල්වාදි 'අවම රාජ්‍යය' න්‍යාය පත්‍රය හමුවේ ඇති අභියෝග මොනවා ද?
(ලකුණු 20 යි)

(10) පහත සඳහන් ඒවායින් දෙකක් ගැන කෙටි සටහන් ලියන්න
(i) සරල බහුතර නියෝජන ක්‍රමය
(ii) අනධිකාරිවාදය
(iii) මහජන මතය
(iv) බලපෑම් කණ්ඩායම්
(v) ශ්‍රී ලංකාවේ ඒකාධිපති ප්‍රවනතා
(එක් කොටසකට ලකුණු 10 බැගිනි)

♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦